**වැඩිහිටි වන්දනා වාරිකා වෙනුවෙන් ආධාර ලබාදීම - 2024**

❖ **හැඳින්වීම**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් දිවයින පුරා වැඩිහිටි සංවිධාන පිහිටුවා පවත්වාගෙන යනු ලබන අතර, මෙම වැඩිහිටි සංවිධාන, විවිධ නිර්මාණාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ඉතා සාර්ථක අන්දමින් පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව වැඩිහිටි සංවිධාන මගින් ක්‍රියාත්මක කරනු ලබන එම වැඩසටහන් මගින් වැඩිහිටි ප්‍රජාවගේ මානසික සුවය සංවර්ධනය කිරීමට මහත්සේ ඉවහල් වේ. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වැඩිහිටියන් විසින් මහත් පරිශ්‍රමයක් දරමින් අරමුදල් සම්පාදනය කරගනු ලබයි. වැඩිහිටියන් දරන මෙකී ප්‍රයත්නයන් දිරිගැන්වීමේ අරමුණින් යුතුව වන්දනා වාරිකා වෙනුවෙන් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් මූල්‍ය අනුග්‍රහය ලබාදීම මෙම වැඩසටහන මගින් සිදුකරනු ලබයි.

❖ **ඉල්ලීම් ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක ක්‍රමවේදය**

01. 2024 වර්ෂය සඳහා සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්ම නියෝජනය වන පරිදි මුදල් ආධාර ලබාදීමට නියමිත අතර, සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකින් හා සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යලයකින්ම අවම වශයෙන් එක් වාරිකාවක් වෙනුවෙන් ආධාර ලබාගැනීම සඳහා ඉල්ලුම්කළ යුතුය. 2024 වර්ෂය සඳහා අගෝස්තු 31 දින දක්වා ඉල්ලීම් ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.

02. ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබන වැඩිහිටි සංවිධානය (ග්‍රාමීය/ප්‍රාදේශීය/ දිස්ත්‍රික්) ලියාපදිංචි සංවිධානයක් වියයුතු අතර, ඒ සඳහා වැඩිහිටි සංවිධානයේ ලියාපදිංචි සහතිකයේ පිටපතක් හෝ පිළිගත හැකි වෙනත් තහවුරුවක් ඉදිරිපත් කළ යුතුය.

03. අදාල වැඩිහිටි සංවිධානය පසුගිය වසර 05 තුළ ක්‍රියාකාරීව පවත්වා තිබිය යුතු අතර ඒ බව, විෂය නිලධාරි (සමාජ සේවා නිලධාරි / වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි /සංවර්ධන නිලධාරි) විසින් සිය වාර්තාව මගින් සහතිකකර තිබිය යුතුය.

04. වන්දනා වාරිකාව සම්බන්ධව අදාල වැඩිහිටි සංවිධානයේ මහා සභා රැස්වීමක යෝජනා ස්ථිරත්වයවයක් තිබිය යුතු අතර, අදාල වාර්ථාව සත්‍ය පිටපතක් බවට, රජයේ නිලධාරියෙක් විසින් සහතිකකරන ලද ඇමුණුමක් මගින් ඉදිරිපත් කළ යුතුය.

05. වන්දනා වාරිකාව සඳහා සහභාගිවන වැඩිහිටියන්ගේ **අත්සන සහිත** නාමලේඛණයක් ඉදිරිපත් කළයුතුය.

06. අවම වශයෙන් වැඩිහිටියන් **50 දෙනෙකු**වත් අදාල වන්දනා වාරිකාව සඳහා සහභාගි විය යුතුය.

07. වන්දනා වාරිකාව යන ප්‍රදේශය, ගමන් මාර්ගය, වියදම් ඇස්තමේන්තුව හා ගමන යාමට යෝජිත දිනය ඇතුළත් ඉල්ලීම් ලිපියක් අදාල වැඩිහිටි සංවිධානය විසින් දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කළ යුතු අතර, එම ලිපිය ඉල්ලීම සමග ඉදිරිපත් කළ යුතුය.

08. ඒ අනුව, ඉහත සඳහන් පරිදි අවශ්‍ය ලිපිලේඛණ සමග දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් විසින් අදාල ඉල්ලීම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත්කළ යුතුය.

- මේ සඳහා ඉල්ලීම් කිරීමේදී ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛණ
  - අදාල වැඩිහිටි සංවිධානය ලියාපදිංචි සහතිකයේ සහතික කරන ලද පිටපතක් හෝ ඒ බව තහවුර කෙරෙන ලිපිය
  - සක්‍රිය වැඩිහිටි සමියක් බව සහතික කෙරෙන විෂය නිලධාරි වාර්තාව
  - රජයේ නිලධාරියෙක් විසින් සහතිකකරන ලද වැඩිහිටි සංවිධානයේ මහා සභා රැස්වීම් වාර්තාව
  - සහභාගීවන වැඩිහිටියන්ගේ අත්සන සහිත නාමලේඛණය (අවම 50 දෙනෙකු විය යුතුය)
  - විෂය නිලධාරි සකස් කර හෝ නිර්දේශ කරන ලද දළ ඇස්තමේන්තුව
  - වාරිකාව යාමට යෝජිත දිනය ඇතුළත් අදාල වැඩිහිටි සංවිධානයේ ඉල්ලීම් ලිපිය

09. ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සලකා බලා රු. 75,000/= ක උපරිමයකට යටත්ව ආධාර මුදල් ලබාදෙනු ලබන අතර, එම මුදල් වාරිකාවේ වියදම් සඳහා පමණක් වියදම්කළ යුතුය.

10. අදාල මුදල් දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලබාදෙනු ලබන අතර, එම චෙක්පත සඳහා වන ලදුපත (පොදු 172 ආකෘතිය) කඩිනමින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ලැබීමට සැලැස්විය යුතුය.

11. අදාල වන්දනා වාරිකාව අවසන් වූ පසු ඒ සම්බන්ධව, වියදම් විස්තරය ඇතුළු ඡායාරූප සහිත, වැඩිහිටි සංවිධානයෙන් ලබාගත් සවිස්තාරාත්මක වාර්තාව විෂය නිලධාරිගේ නිර්දේශය සහිතව, කඩිනමින් මා වෙත ඉදිපත්කළ යුතුය.

12. මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබෙන ඉල්ලීම් අතුරින් ප්‍රතිලාභී වැඩිහිටි සංවිධානය සඳහා ප්‍රමුඛතාව ලබාදීමේදී සලකා බැලියයුතු සාධක

- වැඩිහිටි සංවිධානය ලියාපදිංචි කරන ලද දිනය
- සක්‍රිය සාමාජික සංඛ්‍යාව
- පසුගිය වසර 02 ක කාලය තුළ වැඩිහිටි සංවිධානය විසින් බාහිර සමාජය වෙනුවෙන් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්
- සමිතිය සතු මූල්‍ය සක්‍යතාව (අඩු මූල්‍ය සක්‍යතාවය සහිත සමිතිවලට වැඩි අවධානයක් ලබාදිය යුතුය.)
- සාමාජිකයින්ගේ ආර්ථික සුබසාධනය වෙනුවෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග
- ආදායම් උත්පාදක වැඩසටහන් /ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම
- වැඩිහිටි සංවිධානය ලබාගත් ප්‍රාදේශීය ජයග්‍රහණ
- නියමිත පරිදි රැස්වීම් වාර පැවැත්වීම හා නිලවරණ පැවැත්වීම
- මෙම වැඩසටහන සඳහා පළමුවරට ඉල්ලීම ඉදිරිපත් කිරීම

කේ.ජී. ලැනරෝල්
අධ්‍යක්ෂ